# වාර්ෂික වාර්තාව
# 2013/2014

LLTL

සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

| පටුන | පිටුව |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 3 |
| සභාපතිගේ පණිවිඩය | 4 |
| ආයතනික පැතිකඩ | 5 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 6 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 6 |
| විශේෂ මූල්‍ය සිදුවීම් | 7 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 8 |
| ආයතනික පාලන ප්‍රකාශය | 12 |
| විගණන කමිටු වාර්තාව | 13 |
| මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 15 |
| විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 21 |

## ***දැක්ම සහ මෙහෙවර***

### *දැක්ම*

- ප්‍රසම්පාදනය සහ ව්‍යාපෘති සඳහා ආදර්ශවත් පහසුකම් සැපයීම මගින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම

### *මෙහෙවර*

- බාහිර රහස්‍යබව සහ අභ්‍යන්තර පාරදෘශ්‍යබව පවත්වා ගනිමින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට , පොලීසියට සහ රජයට අයත් අනෙකුත් ආයතනවලට විදේශ රාජ්‍යයන්ට අයත් සංවිධාන සහ නිෂ්පාදකයන්ගෙන් කඩිනම් ආකාරයෙන් සීමිත සහ උපාය මාර්ගිකව වැදගත් හමුදා උපකරණ ප්‍රසම්පාදනය සඳහා පහසුකම් සැපයීම
- පර්යේෂණ සහ සංවර්ධනය සඳහා සහාය වීම සහ දේශීය ආරක්ෂක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- ජාතික ආරක්ෂක ගම්‍යතාවන් සහිත ව්‍යාපෘති ආරම්භ කිරීමට/ සිදු කිරීමට භාරගැනීම සහ කළමනාකරණය කිරීම

# සභාපතිගේ පණිවිඩය

2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජිස් සමාගමේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

2013/14 සඳහා වන අපගේ ප්‍රතිඵල මගින් ව්‍යාපාරික සැලස්ම සාර්ථකව ක්‍රියාවට නැංවීම, ප්‍රධාන විධායක නිලධාරි සහ ඔහුගේ කණ්ඩායමේ කැපවීම සහ විනයගරුක පිරිවැය සහ වත්කම් කළමනාකරණය පිළිබිඹු කරයි .ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට ප්‍රසම්පාදන පහසුකම් සැපයීමේ සිය ප්‍රධාන ක්‍රියාකාරකමේ සිට රජයේ විවිධ ආයතනවලට උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම දක්වා ද සමාගම සිය සේවා ව්‍යාප්ත කර තිබේ.

සමාලෝචිත වර්ෂය සඳහා ආදායම පෙර වසරේ පැවැති රු. මිලියන 130.62 සිට රු. මිලියන 95.17 දක්වා අඩු විය. මේ සඳහා ප්‍රධානතම හේතු වූයේ හමුදාමය ප්‍රසම්පාදන සඳහා ආරක්ෂක හමුදාවන්ට ජාතික අයවැය මගින් වෙන් කළ මුදල් ප්‍රමාණය අඩුකිරීමයි. කෙසේවෙතත් 2013/14 දී සමාගම විසින් ක්‍රියාවට නැංවූ ප්‍රශංසනීය මූල්‍ය පරිවයන් හේතුවෙන් 2012/13 දී පැවැති 13.31% ට සාපේක්ෂව 16.36% ක මෙහෙයුම් ලාභ ආන්තිකයක් වාර්තා කරන ලදී. තවද, පෙර වසරේ 10.83% ක් වූ ශුද්ධ ලාභ ආන්තිකයට සාපේක්ෂව 11.43% ක ශුද්ධ ලාභ ආන්තිකයක් ළඟා කරගන්නා ලදී.

ආරක්ෂක හමුදා විසින් දායකත්වය සපයන ලද ආරම්භක ප්‍රාග්ධනය ප්‍රාග්ධනීකරණය කිරීම මගින් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 80 දක්වා ඉහළ නංවාගන්නා ලදී. තවද, සමාගමේ සියලු කොටස්වල හිමිකාරිත්වය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරන ලදී.

වසර තුළ ප්‍රාග්ධනය මත වාර්තා ගත කරන ලද ලාභය 9.96% ක් වූ අතර රුපියල් මිලියන 1.05 ක ලාභාංශ ද සමාගම ගෙවන ලද.අතර එය පසුගිව මහා සභා රැස්වීමේදී අනුමත කරන ලැබීය.

අනාගත අභියෝග ජය ගැනීමට පැහැදිළි උපාය මාර්ගයක් සතු බවට වග බලා ගන්නා අතරම සිය සේවා ව්‍යාප්ත කිරීම මගින් තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමට ද සමාගම සැලසුම් කරයි. එබැවින්, එළඹෙන වසරවලදී වඩා ඉහළ ලාභදායීත්වයක් සඳහා වග බලා ගන්නා අතරම රජයේ සංවර්ධන අරමුණු සඳහා තවදුරටත් සහාය වීමට අඛණ්ඩව තමන්ට ජාතික මට්ටමින් කටයුතු කළ හැකියැයි ල.ලො.ටෙ.ස . විශ්වාස කරයි.

අපේක්ෂා කළ ප්‍රතිඵල සපුරා ගැන්මට ලබාදුන් අඛණ්ඩ මගපෙන්වීම ලබාදුන් රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ශූර නායකත්වය වෙනුවෙන් ඒ මහතාට ස්තූතිය පිරිනැමීසට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම, මෙම වර්ධනය සඳහා මහඟු දායකත්වයක් සැපයූ ප්‍රධාන විධායක නිලධාරී ජයන්ත වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් යුත් ල.ලො.ටෙ.ස . කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උද්යෝගය ඇගයීමට ද මෙය ඉතා උචිත අවස්ථාවක් යයි මම හඟිමි. ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවේ හමුදාපතිවරුනට හා පොලිස්පතිතුමාට සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලට ද මාගේ අවංක ස්තූතිය පිරිනමන්නෙමු.

සෑම අවස්ථාවකදීම සිය උපදෙස් හා මගපෙන්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහෝදර සාමාජිකයන්ට මම ස්තූතිවන්ත වන්නෙමි..

නිමල් පෙරේරා
සභාපති

## සමාගම් පැතිකඩ

| | |
|---|---|
| සමාගමේ නම | : සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම |
| නෛනතික තත්ත්වය | : ආධීනති සීමාසහිත පොදු සමාගමකි |
| ලියාපදිංචි කාර්යාලය | : 4-205, බී.එම්.අයි.සී.එච්ළ බෞද්ධාලෝක මාවත<br>කොළළඹ-07 |
| සංස්ථාගත කළ දිනය | : 2006 සැප්තැම්බර් 04 ( 2010 සැප්තැම්බර් 01 වන දින නැවත ලියාපදිංචි කරන ලදි.) |
| සමාගමේ ලියාපදිංචි අංකය | :N(PBS) 1331 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | :එන් .පෙරේරා මහතා - සභාපති<br>එල් .ආර් .ද සිල්වා මහතා - අධ්‍යක්ෂ<br>එල් .එන් .ද සිල්වා චන්ද්‍රසේන මිය -අධ්‍යක්ෂ/ සමාගමේ ලේකම්<br>එස්.එම් .පියතිස්ස මහතා -අධ්‍යක්ෂ<br>එස් .සේනාරත්න මහතා- අධ්‍යක්ෂ |
| ලේකම් | : එල් .එන් .ද සිල්වා චන්ද්‍රසේන මිය<br>,383කෝට්ටේ පාර ,<br>රාජගිරිය.<br>දුරකථන 011 –286879 3 |
| විගණකවරු | :බී .ආර් .ද සිල්වා සහ සමාගම (වරලත් ගණකාධිරිවරු<br>224 ,/විජය කුමාරතුංග මාවත,<br>කොළඹ.05<br>දුරකථන 011 / 4510368/011 : –4510268 |
| බැංකුකරුවෝ | :ලංකා බැංකුව<br>නිදහස් චතුරශ්‍ර ශාඛාව<br>ටොරින්ටන්<br>කොළඹ07 .<br>දුරකථන 011 : –2678073 |

# අධ්‍යක්ෂ මණ්ඩලය

නිමල් .පෙරේරා මහතා - සභාපති

ලලිත් .ආර් .ද සිල්වා මහතා

ලෙයිෂා එන් .ද සිල්වා චන්ද්‍රසේන මිය -අධ්‍යක්ෂ/ සමාගමේ ලේකම්

එස්.එම් .පියතිස්ස මහතා

සුදර්ශන් සේනාරත්න මහතා

**_ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය_**

| | |
|---|---|
| ජයන්ත වික්‍රමසිංහ මහතා | - ප්‍රධාන විධායක නිලධාරී |
| නිශාන්ත ද සිල්වා මහතා | - ප්‍රධාන මෙහෙයුම් නිලධාරි |
| ශ්‍රී ලාල් මහින්දපාල මහතා | -ප්‍රසම්පාදන පහසුකම් සහ මූල්‍ය ප්‍රධානි |
| ඉංජිනේරු ලලිත් ලියනගේ මහතා | -තොරතුරු තාක්ෂණ ප්‍රධානි |
| ධම්මික ප්‍රනාන්දු මහතා | -ප්‍රසම්පාදන ,පහසුකම් සහ සැපයුම් දාම ප්‍රධානි |
| උපුල් ගුණසේකර මහතා | -ව්‍යාපෘති කළමනාකරු |
| දමිත ජයසේකර මහතා | -මානව සම්පත් සහ පරිපාලන කළමනාකරු |
| සරත් පීරිස් මහතා | -අභ්‍යන්තර විගණක |

# විශේෂ මූල්‍ය සිදුවීම්

**විශේෂ මූල්‍ය සිදුවීම් සහ අනුපාත විශ්ලේෂණය 2013/14**

| | | 2014<br>Rs. | 2013<br>Rs. | Change<br>% |
|---|---|---|---|---|
| ආදායම | | 95,174,119 | 130,618,906 | (27) |
| ආදායමේ සාජු පිරිවැය | | 13,678,828 | 30,939,078 | (56) |
| දළ ලාභය | | 81,495,291 | 99,679,828 | (18) |
| බදුවලට පෙර ලාභය | | 15,573,236 | 17,380,167 | (10) |
| බදුකරණය | | 4,697,544 | 3,234,532 | 45 |
| බදුවලට පසු ලාභය | | 10,875,692 | 14,145,635 | (23) |
| මුළු ස්කන්ධ | | 109,044,984 | 119,391,928 | (9) |
| ජංගම නොවන වත්කම් | | 8,562,027 | 12,527,964 | (32) |
| ජංගම වත්කම් | | 157,022,921 | 159,090,667 | (1) |
| ජංගම බැරකම් | | 52,497,164 | 48,143,787 | 9 |
| මුළු වත්කම් | | 165,584,948 | 171,618,630 | (4) |
| ජංගම නොවන බැරකම් | | 4,042,800 | 4,082,916 | (1) |
| ශුද්ධ වත්කම් | | 109,217,620 | 119,391,928 | (9) |
| | | | | |
| අනුපාත | | | | |
| කොටස් ගණන | | 8,000,205 | 205 | |
| ගෙවූ ලාභාංශ | | 1,050,000 | - | |
| කොටසක් සඳහා ඉපැයුම් | රු. | 1.36 | 69,003 | (100) |
| කොටසක් සඳහා ලාභාංශ | රු. | 0.13 | N/A | |
| ලාභාංශ ආවරණය | )කාල( | 10.36 | N/A | |
| කොටසක් සඳහා ශුද්ධ වත්කම් | රු. | 14 | 582,400 | (100) |
| ස්කන්ධ මත ලාභය | % | 9.97 | 11.85 | (16) |
| මුළු වත්කම් මත ලාභය | % | 6.57 | 8.24 | (20) |
| දළ ලාභ අනුපාතිකය | % | 85.63 | 76.31 | 12 |
| මෙහෙයුම් ලාභ අනුපාතිකය | % | 16.36 | 13.31 | 23 |
| ශුද්ධ ලාභ අනුපාතිකය | % | 11.43 | 10.83 | 6 |
| ජංගම අනුපාතිකය | )කාල( | 2.99 | 3.30 | (9) |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම්ද ඒ පිළිබඳ ස්වාධීන විගණන වාර්තාවද සමගින් 6 වැනි වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරයි.

***<u>වර්ෂය පිළිබඳ සමාලෝචනය</u>***

සමාලෝචිත වර්ෂය තුළ සමාගම රු .බිලියන 28.15 ක වටිනාකමකට ප්‍රසම්පාදන සඳහා පහසුකම් සපයමින් රු .මිලියන 703.81 පරිපාලන වියදම් උපයා ගන්නා ලදී .

අදාල සන්නද්ධ හමුදා විසින් වෙන් කරන ලද වැය ශීර්ෂ ප්‍රකාරව මෙම වසර සඳහා රු මිලියන 59.05 ක් පරිලපාලන ආදායම ලෙස සමාගම පිළිගෙන ඇත්තේය.

සමාගම රජයේ ඇතැම් ආයතන සඳහා උපදේශන සහ කළමනාකරණ සේවා සැපයීමේ නියැළුණි.

රු. මිලියන 95.17 ක උපලබ්ධ ආදායමක් සහ රු. මිලියන 15.57 ක බදු පෙර ශුද්ධ ලාභයක් සමගින් සමාගම 2014 මාර්තු 31 න් අවසන් වසර තුළ සිය මෙහෙයුම්වල වර්ධනයක් පවත්වා ගනු ලැබීය.

සමාගමේ මෙහෙයුම් ආරම්භ කිරීමේ සහ අඛණ්ඩව පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ආරක්ෂක හමුදා විසින් දායක කරන ලද රු. මිලියන 80 ක් වූ ආරම්භක ප්‍රාග්ධනය සමාගම ප්‍රාග්ධනීකරණය කරන ලදී. ඒ අනුව හරිත සාමාන්‍ය කොටස් මත කොටසක ඉපැයුම් රු. 12.10 කි.

සමාගම ප්‍රථම වතාවට සු.ම.ව .සඳහා ශ්‍රී.ල.මූ.වා .ප්‍රමිතිවලට අනුකූල වන පරිදි 2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා මූල්‍ය වාර්තා සකස්කරන ලදී 2012 .මාර්තු 31 න් අවසන් වසර දක්වා සහ ඇතුලුව සියලු කාල සීමාවන් සඳහා .සමාගම සිය මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ 2012 මාර්තු 31 දක්වා බල පැවැත්වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූලවය .ඒ අනුව ,ශ්‍රී.ල.මූ.වා .ප්‍රමිති යොදාගනිමින් සමාගම වත්මන් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කෙරෙන සූත්‍ර ක්‍රමවේදය මත පදනම්ව විලම්භිත බදු වත්කම් සහ පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කරන ලදී .

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

2013/2012වසරේදී ද සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ජාතික ආරක්ෂක ගම්‍යයන් සහිත හමුදාමය භාණ්ඩ සඳහා පහසුකම් සැපයීමය .රජයේ ඇතැම් ආයතන සඳහා උපදේශන සහ කළමනාකරණ සේවා සැපයීමේ සමාගම රජයේ ඇතැම් ආයතන සඳහා උපදේශන සහ කළමනාකරණ සේවා සැපයීමේ ද සමාගම නියැළුණි. තවද, ජාතියේ අභිවෘද්ධිය අරමුණු කරගත් තවත් ව්‍යාපෘති ගණනාවක් එළඹෙන වසරවලදී ක්‍රියාවට නැංවීමට නියමිතව තිබේ .

**<u>ආයතනික පාලනය</u>**

උපාය මාර්ගික අරමුණු සකස් කිරීම ,නායකත්වය සැපයීම සහ කළමනාකාරිත්වය අධීක්ෂණය ඇතුළුව සමාගම පරිපාලනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ .

**<u>ආදායම</u>**

2014 මාර්තු31 න් අවසන් වසර සඳහා ආදායම රු.මිලියන 95.17 ක් විය.

*විස්තීරණ ආදායම් ප්‍රකාශනය*

| **මූල්‍ය සාරාංශ** | **2013/14** | | **2012/13** |
|---|---|---|---|
| | රු. | | රු. |
| ආදායම | **95,174,119** | | **130,618,906** |
| විකුණුම් පිරිවැය | **(13,678,828)** | | **(30,939,078)** |
| දළ ලාභය | **81,495,291** | | **99,679,828** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | **2,828,265** | | **314,816** |
| පරිපාලන වියදම් | **(74,762,144)** | | **(88,180,375)** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ | **9,561,412** | | **13,814,268** |
| මූල්‍ය පිරිවැය | **(1,807,174)** | | **(3,007,300)** |
| මූල්‍ය ආදායම | **7,818,999** | | **6,573,199** |
| බදු පෙර ලාභය | **15,573,236** | | **17,380,166** |
| බදුකරණය | **(4,697,544)** | | **(3,234,532)** |
| **බදු වලින් පසු ලාභය** | **10,875,692** | | **14,145,635** |

*පෙර වසර සඳහා සංඛ්‍යාලේඛන සු.ම.ප.ආ .සඳහා වන ශ්‍රී.ල.මු.වා.ප්‍ර අනුකූල වන පරිදි ප්‍රතිසමායෝග කර ප්‍රති වර්ගීකරණය කරන ලදී .*

***ප්‍රාග්ධන වියදම්***

වසර තුළ ස්ථාවර වත්කම් අත් කර ගැනීම සඳහා දැරූ මුළු ප්‍රාග්ධන වියදම ,පෙර වසරෙහි රු .4,367,817.92 ට සාපේක්ෂව රු. 1,899,035 ක් විය.

***දේපල ,පිරියත සහ උපකරණ***

සමාගමේ දේපල ,පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයන් 10 වන සටහනෙහි පෙන්නුම් කර ඇත.

***සංචිත***

වසර තුළ ප්‍රාග්ධන සහ ආදායම් සංචිත සංචලනයන් ,ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනයේ දක්වා ඇත.

***ලාභාංශ***

2014 සැප්තැම්බර් 19 දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේදී 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා රු. 1,040,027 ක් ලෙස කොටසකට රු. 0.13 ක ලාභාංශ ගෙවීමක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරන ලදී. ශ්‍රීලගිප්‍ර 12 -"ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්" අනුකූලව 2014 මාර්තු 31 මූල්‍ය ප්‍රකාශනවල මෙම නිර්දිෂ්ඨ ලාභාංශ බැරකමක් ලෙස පිළිගනු නොලැබේ.

***වාර්තාකරණ කාල සීමාව අවසානවීමෙන් පසු සිදුවීම්***

ගිණුම්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීමට අවශ්‍ය තත්ත්වයන් වාර්තාකරණ කාල සීමාව අවසාන වීමෙන් පසු මතුව නොමැත.

***අධ්‍යක්ෂ මණ්ඩල කමිටු***

අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත නම් සඳහන් සාමාජිකයන් විගණන කමිටුවේ සේවය කරන ලදී.

1. එස් .එම් .පියතිස්ස (සභාපති)
2. ලලිත් ආර් .ද සිල්වා මහතා
3. සුදර්ශන සේනාරත්න මහතා

***කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා***

2013/14 මූල්‍ය වර්ෂය තුළ කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳියා පහත දැක්වෙන පරිදි වේ.

1) නිමල් පෙරේරා මහතා නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවීම නිසා.,
   a) වොටර්ස් එජ් හෝටල් සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය
   b) ව්‍යවාසය සම්පත් සැලසුම්කරණ උපදේශන ව්‍යාපෘතිය

2) බී.එල්.එන් ද සිල්වා චන්ද්‍රසේන මිය රක්නා ආරක්ෂා ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වීම නිසා.,
   a) රක්නා ආරක්ෂා ලංකා සමාගම සඳහා ආයතනික සැලැස්ම සකස්කිරීම

***අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු***

වසර සඳහා අධ්‍යක්ෂවරුවරුන්ගේ ගාස්තුව රු .1,770,000 =/ක් විය .

*අධ්‍යක්ෂවරු කොටස් දැරීම*

2014 මාර්තු 31 දායින් අවසන් වූ මූල්‍ය කාලසීමාව තුළ අධියක්ෂවරු සමසාගමේ කොටස් දරනු නොලැබීය

***විගණකවරු***

විගණකවරයා ලෙස බී .ආර් .ද සිල්වා සහ සමාගම (වරලත් ගණකාධිකාරි) විශ්‍රාම ලැබීය.

"ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවාසය සඳහා සංයුක්ත පාලනයේ යහපත් පරිචය සංග්‍රහයේ" නියමයන් ප්‍රකාරව නව විගණකවරයෙක් පත්කිරීමට සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකය නිශ්චය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පවරන යෝජනාවක් වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කරනු ඇත. 2015 මාර්තු 31 දායින් අවසන් වන මූල්‍ය වසර සඳහා විගණකවරු ලෙස ටියුඩර් පෙරේරා සහ සමාගම, වරලත් ගණකාධිකාරී පත්කිරීමට අධ්‍යක්ෂවරු අනුමතිය ලබා දෙන ලදී.

2014 මාර්තු 31 දායින් අවසන් වසර සඳහා බී .ආර් .ද සිල්වා විගණක සමාගමේ පාරිශ්‍රමිකය රු. 155,000/= කි .

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ ප්‍රමාණයට විගණකට මෙහි ඉහත හෙළිදරව් කර ඇති සබඳතා හැරෙන්නට වෙත් කිසිදු සබඳතාවක්) විගණකවරයකු ලෙස හැරුණු විට (සමාගම සමග නොමැත .එසේම විගණකට ,සමාගම කෙරෙහි කිසිදු බැඳියාවක් ද නොමැත.

***ස්තුතිය***

තම බැංකුකරුවන්ගෙන් ,රාජ්‍ය ආරක්ෂක නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් සහ සහ රජයේ ආයතනවලින් ලැබුණු සහයෝගිතාවය සහ උපකාරය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුනට සිය අවංක කෘතවේදිත්වය පළකරයි .

එසේම ,අප කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය ,සහයෝගිතාවය සහ සහයෝගය වෙනුවෙන් කාර්ය මණ්ඩලයට ,සේවා ලාභීන්ට ,සැපයුම්කරුවන්ට සහ අනෙකුත් ව්‍යාපාරික පාර්ශවකරුවන්ට ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අපගේ අවංක ඇගයීම සනිටුහන් කරන්නෙමු .අඛන්ඩ අනුග්‍රාහකත්වය වෙනුවෙන් කොටස්කරුවන්ට ද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය හිමි වේ .

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

නිමල් පෙරේරා
(සභාපති)

## ආයතනික පාලන ප්‍රකාශය

සමාගමේ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර පාලනයේදී කොටස් හිමියන්ගේ වගකීම වනුයේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ යෝග්‍ය පාලන ව්‍යුහයක් පවතින බව සහතික කිරීමයි.

ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය සියලු ක්‍රියාකාරකම් වලදී ව්‍යාපාරික විශ්වාසනීයනත්වය සහ වෘත්තියබව සඳහා කැපව සිටී .එම කැපවීමේ කොටසක් ලෙස ,ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිති සහ යහපත් පරිචයන් වර්ධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහයෝගය දක්වයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් වනුයේ සමාගමේ උපාය මාර්ගික අරමුණු සකස් කිරීම ,ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම ,ව්‍යාපාරයේ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ මහ භාණ්ඩාගාරය වෙත වාර්තා කරීමයි. (පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව)
එසේම , නීති සහ රෙගුලාසි වලට අනුකූල වන්නා වූ ක්‍රියාමාර්ග මගින් කොටස් හිමියන් සහ පරදු දරන්නන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම සහ අවංකත්වය ,පාරදෘශ්‍යභාවය සාධාරණ ගනුදෙනු සහ වගවීමට ප්‍රතිලාභ ලබා දෙන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස් වේ. අවශ්‍ය වූ විටකදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලැබේ . අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂ වරුන්ගෙන් සමන්විත වන අතර සමාගමේ තීරණ ගැනීමේ ක්‍රියාදාමය කෙරෙහි බලපාන්නා වූ ස්වාධීන තීන්දු ගැනීමේ හැකියාව තිබේ.

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් පවත්වා තිබේ .

# විගණන කමිටු වාර්තාව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් ,එනම් එස්. එම්. පියතිස්ස මහතා (සභාපති) ලලිත් ආර් ද සිල්වා සහ සුදර්ශන සේනාරත්න යන මහතුන්ගෙන් සමන්විත විය .විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරයන් සහ වගකීම්වලට පහත කරුණු අයත් වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ,ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කිරීම ඇතුළුව සමාගමේ මූල්‍ය වාර්තා සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාදාමයේ ගුණාත්මකබව සහ අවංකවබවට අදාළ අධීක්ෂණ වගකීම් ඉටු කිරීම

(ආ) 2007අංක 07 දරන සමාගම් පනතේ සහ අනෙකුත් අදාල මූල්‍ය වාර්තාකරණ ආශ්‍රිත රෙගුලාසිවල මූල්‍ය වාර්තාකරණ සහ තොරතුරු අවශ්‍යතා සමග සමාගමේ අනුකූලතාවයට අදාළ අධීක්ෂණ වගකීම් ඉටුකිරීම

(ඇ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින්හි අවශ්‍යතා සැපිරීමට සමාගම් අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් බව සහතික කිරීම පිණිස ඇති ක්‍රියාදාම අධීක්ෂණය පිළිබඳ වගකීම් ඉටුකිරීම සහ නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සමාගම අනුකූල ව බව සහතික කිරීම

(ඈ) සමාගමේ බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීම

(ඉ) බාහිර විගණකවරුන් පත් කිරීම ,යළි පත් කිරීම සහ යෝග්‍ය අවස්ථානුගත තත්ත්වයන් යටතේ ඔවුන් ඉවත් කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම

(ඊ) ව්‍යවස්ථාපිත විගණනය හැරුණු විට සමාගම සඳහා බාහිර විගණකවරුන් විසින් බාරගනු ලබන කිසියම් කාර්යයක සාපේක්ෂ තත්ත්වය) යෝග්‍යතාම් (සලකා බැලීම සහ

(උ) බාහිර විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය සහ නියුක්ත කිරීමේ නියමයන් අනුමත කිරීම

ප්‍රධාන විධායක නිලධාරීට සහ ප්‍රසම්පාදන පහසුකම් සහ මූල්‍ය අංශ ප්‍රධානීන්ටද රැස්වීම්වලට සහභාගී වීමට විගණක කමිටුව ආරාධනා කළද ඔවුන්ගෙන් කවරෙකුට හෝ රැස්වීමෙන් ඉවත් වන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය කමිටුව සතුව තබාගන්නා ලදී .

සමාලෝචන මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුව ,අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නියැලෙන ලදී.

- විගණනය නොකරන ලද මාසික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

- වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචනය

- බාහිර විගණකවරුන් විසින් නිකුත් කරන ලද කළමනාකරණ ලිපිය සමාලෝචනය සහ කළමනාකරණය පසු විපරම් ක්‍රියාමාර්ග අධීක්ෂණය

- පරිපාටි අත්පොත සමාලේචනය (මූල්‍ය, ප්‍රසම්පාදන පහසුකම් සැපයීම, තොරතුරු තාක්ෂණය සහ පරිපාලනය).

- ව්‍යවස්ථාපිත වාර්තාකරණය සහ ගෙවීම් අවශ්‍යතා සමග අනුකූලවීමේ වාර්තාව සමාලෝචනය

- බී .ඒ .ද සිල්වා ,වරලත් ගණකාධිකාරීවරු ,සමාගම විසින් සිදුකරන ලද බාහිර විගණනයේ සඵලත්වය පිළිබඳව කමිටුව සමාලෝචනය කළ අතර ඔවුන් විසින් ඉටුකළ සේවය ඇගයීමට ලක් කරන ලදී. එසේවුවත්, “ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවාසය සඳහා සංයුක්ත පාලනයේ යහපත් පරිචය සංග්‍රහය” නියම කර ඇති පරිදි, වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය ලැබීමට යටත්ව, 2014/15 මූල්‍ය වර්ෂය සඳහා නව විගණකවරයකු පත්කිරීමට කමිටුව යෝජනා කරන ලදී.

## මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත ප්‍රකාශයෙහි දක්වා තිබේ 2007 .අංක 7 දරන සමාගම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශයන්ට අදාළව විගණකවරුන්ගේ වගකීම විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා තිබේ.

සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශ පහත ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ .

(අ) 2014 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

(ආ) 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව.

(ඇ) 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය .

(ඈ) 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්රවාහ ප්‍රකාශය .

2013 මාර්තු 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා සන්සනාදත්මක කාල සීමා දත්ත සමගින් 2014 මාර්තු 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ඉහත මූල්‍ය ප්‍රකාශන සු.ම.ප්‍ර .ආයතන සඳහා වූ ශ්‍රී.ල.මූ.වා.ප්රමිති අනුකූලව පිළියෙල කරන ලදී .

අ. සංගත ආකාරයෙන් තෝරාගෙන සහ ආදේශ කර ඇති උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ යම් ද්‍රව්‍යමය බැහැරවීමක් වේ නම් එය අනාවරණය කරමින් සහ විස්තර කරමින් ,

ආ. සු.ම.ප්‍ර. ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් ,

ඇ. ගනුදෙනුවල ස්වරූපය සහ භාවාර්ථය නිසි අයුරින් පිලිබිඹු වන පරිදි සාධාරණ සහ ඥාණාන්විත තීන්දු සහ ඇස්තමේන්තු සිදු කරමින් ,සහ

ඈ. සමාගම් පනත අනුව අවශ්‍ය තොරතුරු සපයමින්,

මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව අධ්‍යක්ෂවරු විසින් තහවුරු කිරීම අවශ්‍ය වේ .

එසේම ,මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රවර්තන ව්‍යාපාර පදනම ආදේශ කිරීම සාධාරණීකරණය කරමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතුව පවතින බව අධ්‍යක්ෂවරුන් සහතික කිරීමද අවශ්‍ය වේ.

තවද ,සමාගමේ මූල්‍ය තත්ත්වය ,සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව හෙළිදරව් කිරීම පිණිස ප්‍රමාණවත් ගිණුම් වාර්තා සමාගම පවත්වාගෙන යනු ලබන බව සහතික කිරීමටද අධ්‍යක්ෂවරුන්ට වගකීමක් තිබේ.

ඊට අමතරව ,වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමේ සහ සොයා ගැනීමේ අරමුණු ඇතිව යෝග්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පිහිටුවීම මගින් සමාගමේ වත්කම් ආරක්ෂා කරගැනීමට සාධාරණ ක්‍රියා මාර්ග ගැනීමෙහිලා අධ්‍යක්ෂවරු වගකිව යුතු වෙති.


මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමටත් ,විගණකවරුන්ට සිය විගණන මතය ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දෙනු ඇතැයි ඔවුන් සලකනු ලබන ඕනෑම පියවරක් ගැනීමට සහ ඕනෑම පරීක්ෂණයක් පැවැත්වීමට හැකි සෑම සහායක්ම අධ්‍යක්ෂවරුන් සැපයිය යුතුය .

මෙම ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි තම වගකීම් නිසි අන්දමින් ඉටු කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වේ.


**අනුකූලතා වාර්තාව**


සිය උපරිම දැනුම අනුව සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු ,තීරු බදු සහ අයබදු ,සමාගමේ සියලු සේවකයන් වෙනුවෙන් සහ අදාළව ගෙවිය යුතු සියලු දායක මුදල් අයබදු සහ බදු සහ ශේෂපත්‍ර දිනට සමාගම විසින් ගෙවිය යුතු සහ ගෙවීමට නියමිතව තිබූ අනෙකුත් සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා ඇති බව අධ්‍යක්ෂකවරු සනාථ කරයි.


| උපලබ්ධ ආදායම ඇතුළුව සමාගමේ ලාභය | | | | | |
|---|---|---|---|---|---|
| **වර්ෂය** | **2009/10** | **2010/11** | **2011/12** | **2012/13** | **2013/14** |
| දළ ලාභය (මිලියන) | 6.72 | 33.67 | 69.46 | 102.16 | 81.49 |
| මෙහෙයුම් ලාභය (මිලියන) | 4.92 | 10.82 | 4.28 | 13.81 | 9.56 |
| බදුවලින් පසු ලාභය (මිලියන) | 2.03 | 7.65 | 4.71 | 14.14 | 10.87 |
| බදුවලින් පසු සමුච්චිත ලාභය (මිලියන) | (6.70) | 0.94 | 6.94 | 19.39 | 30.26 |





| උපලබ්ධ නොවූ ආදායම ඇතුළුව සමාගමේ ලාභය | | | | | |
|---|---|---|---|---|---|
| **වර්ෂය** | **2009/10** | **2010/11** | **2011/12** | **2012/13** | **2013/14** |
| දළ ලාභය (මිලියන) | 6.86 | 164.80 | 399.94 | 304.98 | 726.26 |
| මෙහෙයුම් ලාභය (මිලියන) | 4.90 | 142.13 | 343.73 | 219.11 | 654.33 |
| බදුවලින් පසු ලාභය (මිලියන) | 2.12 | 92.19 | 246.21 | 155.39 | 467.29 |
| බදුවලින් පසු සමුච්චිත ලාභය (මිලියන) | 779.87 | 872.06 | 1,112.10 | 1,267.49 | 1,734.78 |




TURNOVER
14000000
12000000
10000000
80000000
60000000
40000000
20000000
0
Value Rs
2010
2011
2012
2013
2014
Year


TOTAL EQUITY
14000000
12000000
10000000
80000000
60000000
40000000
20000000
0
Value Rs
2010
2011
2012
2013
2014
Year


TOTAL ASSETS
25000000
20000000
15000000
10000000
50000000
0
Value Rs
2010
2011
2012
2013
2014
Year



Ratio Analysis
120
100
80
60
40
20
0
%
Return on equity
%
Return on total assets
%
Gross profit ratio
%
Operating profit ratio
%
Net profit ratio
(Times)
Current ratio
2014
2013
2012
2011

**බී. ආර්. ද සිල්වා සහ සමාගම**
**වරලත් ගණකාධිකාරිවරු**

පුද්ගලිකයි රහසිගතයි

**සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමේ කොටස්කරුවන් වෙත ඉදිරිපත් කරන ස්වාධීන විගණන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව**

2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් සහ පිටු (01) සිට (18) දක්වා විස්තර කර ඇති පරිදි අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන් වලින් සමන්විත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගමෙහි, මේ සමග ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකාරිත්වයේ වගකීම**

සුළු සහ මධ්‍ය පරිමාණ ආයතන සඳහාවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා සාධාරණව ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරිත්වය සතු වේ. එසේම වංචා හෝ වැරදි හේතුවෙන් සිදුවන ද්‍රව්‍යමය දුෂ්ප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට සහ සාධාරණ අන්දමින් ඉදිරිපත් කරීමට අදාළ අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීම සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සෑදීම මෙම වගකීමට අයත් වේ.

**3. විගණනයේ විෂයපථය සහ මතය ප්‍රකාශ කිරීමේ පදනම**

අපේ වගකීම වනුයේ අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අපගේ මතය ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපගේ විගණනය සිදු කළෙමු. මූල්‍ය ප්‍රකාශ, ද්‍රව්‍යමය දුෂ්පක්‍රාශයන්ගෙන් තොර ද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කිරීම මෙම ප්‍රමිතින් අනුව අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මුදල් ප්‍රමාණ සහ අනාවරණය කිරීම් තහවුරු කරන පරීක්ෂණ පදනම් සාක්ෂි පරීක්ෂා කිරීම විගණනයට අයත් වේ. එසේම යොදාගත් ගිණුම්කරණ මූලධර්ම සහ කළමනාකරණය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීමව මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

පහත (4) ඡේදයේ සඳහන් කරුණු හැරුණු විට අපේ විගණනයේ කාර්යය සඳහා අපේ උපරිම දැනමේ සහ විශ්වාසයේ හැටියට අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළිකිරීම් අපි ලබාගෙන ඇත්තෙමු.

එබැවින්, අපගේ මතය සඳහා සාධාරණ පදනමක් අපගේ විගණනය සපයන බව අපගේ විශ්වාසයයි.

**(4)** පහත දැක්වෙන පරිදි පරිපාලන ගාස්තු ණය ගැතියන්ගේ නිරවද්‍යතාව තහවුරු කිරීම පිණිස සාක්ෂි ලෙස සෘජු තහවුරු කිරීම් නොලැබී තිබුණි.

**<u>ණය ගැතියෝ</u>**

| | රු. ශත |
|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව පොලීසිය- | 6,031,946. 14 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | 31,571,057. 50 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 40,766,927.17 |
| රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 18,787,070. 31 |

**(5)** **<u>මතය</u>**

අපගේ මතය අනුව, ඉහත (4) ඡේදයේ සඳහන් කරුණු සහ එමගින් පැන නගින කිසියම් ආනුෂංගික ගැලපීම් හැරුණු විට , සමාගම විසින් 2014 මාර්තු 31 දිනෙන් වඅසන් වන වර්ෂය සඳහා නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇති අතර සුළු සහ මධ්‍ය ප්‍රමාණ ආයතන සඳහාවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව 2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ මගින් සමාගමේ කටයුතු පිළිබඳව සහ එදින අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙයි.

**(6)** **<u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>**

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ අවශ්‍යතා සමග ද අනුකූල වේ.

බී. ආර්. ද සිල්වා සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ 05.
දිනය:- 1.09.2014

**සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

විස්තීරණ ආදායම් ප්‍රකාශය

2014 මාර්තු 31දායින් අවසන් වසර සඳහා

| | සටහන | 2014<br>රු. ශත | 2013<br>රු. |
|---|---|---|---|
| ආදායම | (3) | 95,174,119.47 | 130,618,906 |
| ආදායමේ සෘජු පිරිවැය | | (13,678,828.12) | (30,939,078) |
| දළ ලාභය | | 81,495,291. 35 | 99,679,828 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | (4) | 2,828,265.11 | 314,816 |
| | | 84,323,556.46 | 99,994,644 |
| පරිපාලන වියදම | | (74,762,144.78) | (86,180,375) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ. | (5) | 9,561,411.68 | 13,814,268 |
| මූල්‍ය පිරිවැය | (6) | (1,807,175.00) | (3,007,300) |
| මූල්‍ය ආදායම | (7) | 7,818,999.44 | 6,573,199 |
| බදුවලට පෙර ලාභය | | 15,573,236.12 | 17,380,166 |
| ආදායම් බදු වියදම් | (8) | (4,697,544.00) | (3,234,532) |
| වසර සඳහා ලාභය | | 10,875,692.12 | 14,145,634 |
| එකතු කළා: වෙනත් විස්තීර්ණ ආදායම | | - | - |
| මුළු විස්තීර්ණ ආදායම | | 10,875,692.12 | 14,145,634. |
| කොටසක් සඳහා ඉයැයුම් | (9) | 12.10 | 69,003 |

පිටු අංක (05) සිට (17) දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේම අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

**සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම** **පිටුව (02)**

**2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. ශත | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | (10) | 7,150,677.92 | 9,881,573 |
| අස්පෘෂ්‍ය වත්කම් | (11) | 1,403,175.80 | 2,104,764 |
| විලම්භිත බදු වත්කම් | (12) | 8,173.00 | 541,627 |
| | | 8,562,026.72 | 12,527,964 |
| ජංගම වත්කම් | | | |
| ආයෝජන | (13) | 35,189,276.51 | 79,742,682 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | (14) | 121,065,457.91 | 76,754,877 |
| ලැබිය යුතු ආදායම් බදු | (15) | 713,039.94 | 2,527,197 |
| මුදල් සහ මුදලට සමාන දෑ | (16) | 227,783.00 | 65,910 |
| | | 157,195,557.36 | 159,090,666 |
| **මුළු වත්කම්** | | 165,757,584.08 | 171,618,630 |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | (17) | 80,002,050.00 | 2,050 |
| මූලික ප්‍රාග්ධනය | (18) | - | 100,000,000 |
| රඳවාගත් ඉපැයුම් | | 29,215,570.44 | 19,389,878 |
| **මුළු ස්කන්ධ** | | 109,217,620.44 | 119,391,928 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැදීම් | (19) | 4,042,800.00 | 4,082,916 |
| | | 4,042,800.00 | 4,082,916 |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු ලාභාංශ | | 945,000.00 | - |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | (20) | 39,559,299.64 | 40,341,415 |
| බැංකු අයිරා | (21) | 11,992,864.00 | 7,802,371.80 |
| | | 52,497,163.64 | 48,143,788 |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | 165,757,584.08 | 171,618,630 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා හා අනුකූල වේ

**………………………………**

**……………………**

**ප්‍රධාන විධායක නිලධාරි** **දිනය**

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ,

| | | නම | අත්සන |
|---|---|---|---|
| අධ්‍යක්ෂවරු | : | 1. නිමල් පෙරේරා | ……………………………………… |
| | | 2…………………… | ……………………………………… |

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

අනුමත කළ දිනය 2014.01.24

පිටු අංක (05) සිට (17) දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේම අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

## ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

## අයිතිය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

## 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා

| | *ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. ශත* | *මූලික ප්‍රාග්ධනය රු. ශත* | *රඳවාගත් ඉපැයුම් රු. ශත* | *එකතුව රු. ශත* |
|---|---|---|---|---|
| **2012 අප්‍රයෙල් 01 දිනට ශේෂය** | 2,050.00 | 100,000,000.00 | 6,970,607.00 | 106,972,657.00 |
| පෙර වසරේ ගැලපීම | - | - | (1,726,363.00) | (1,726,363.00) |
| වර්ෂය සඳහා ලාභය | - | - | 14,145,634.32 | 14,145,634.32 |
| **2013 අප්‍රේල් 31 දිනට ශේෂය** | 2,050.00 | 100,000,000.00 | 19,389,878.32 | 119,391,928.32 |
| ආරම්භක ප්‍රාග්ධනය පැවරුම | 80,000,000.00 | (80,000,000.00) | - | - |
| ලියා හැරීම්- නොගෙවූ ආරම්භක ප්‍රාග්ධනය | - | (20,000,000.00) | - | (20,000,000.00) |
| බෙදා හරින ලද ලාභාංශ | - | - | (1,050,000.00) | (1,050,000.00) |
| වසර සඳහා ලාභය | - | - | 10,875,692.12 | 10,875,692.12 |
| **2014 මාර්තු 31 දිනට ශේෂය** | 80,002,050.00 | - | 29,215,570.44 | 109,217,620.44 |

පිටු අංක (05) සිට (17) දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේම අත්‍යවශ්‍ය කොටසක් වන්නේය

## ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2014 මාර්තු 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය | 15,573,236 | 17,380,166 |
| **ගැලපීම්** | | |
| CRD ව්‍යාපෘතියේ අධි සැපයූ පිරිවැය | (747,405) | - |
| පෙර වසර සඳහා ගැලපීම් | - | (1,726,363) |
| ක්ෂය වීම් | 5,108,883 | 5,252,831 |
| මූල්‍ය පිරිවැය | 1,807,175 | 3,007,300 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | (40,116) | 579,508 |
| පොළී ආදායම | (7,818,999) | (6,573,199) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලත් ලාභය | (917,865) | - |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ) | 12,964,908 | 17,920,244 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම | (71,008,795) | 72,122,212 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම) | 2,018,730 | (5,748,275) |
| මෙහෙයුම් වලින් උත්පාදිත මුදල් | (56,025,158) | 84,294,181 |
| ගෙවනු ලැබූ මූල්‍ය වියදම් | 1,807,175 | (3,007,300) |
| ගෙවනු ලැබූ ආදායම් බදු | (1,642,567) | |
| ගෙවනු ලැබූ ආර්ථික සේවා ගාස්තු | - | (561,578) |
| ගෙවනු ලැබූ රඳවාගැනීමේ බදු | | (658,633) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් | (59,474,899) | 80,066,671 |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත සහ උපකරණ අත් කර ගැනීම | (1,899,035) | (2,263,055) |
| ලැබුණු පොලිය | 55,838 | 6,573,199 |
| ආයෝජන අත් කර ගැනීම/ආයෝජන බැහැර කිරීම | (1,899,035) | (38,790,329) |
| දේපල, පිරියත සහ උපකරණ මත විකුණුම් කොමිස් | (34,500) | - |
| දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම | 1,175,000 | - |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | 55,551,279 | (34,480,185) |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| ලාභාංශ බදු ප්‍රේෂණ | (105,000) | - |
| ණය ආපසු ගෙවීම | - | (15,800,000) |
| මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | (105,000) | (15,800,000) |
| **මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | (4,028,620) | 29,786,485 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ** | (7,736,462) | (37,522,947) |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | 11,765,081 | (7,736,462) |
| **මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය** | | |
| බැංකුවේ ඇති මුදල් - (අයිරාව) | (11,992,864) | (7,802,372) |
| බැංකුවේ ඇති මුදල් -ගි.අ.5960160 | 2,257 | 11,740 |
| සම්පත් බැංකුව- ජංගම ගිණුම | 195,526 | 24,170 |
| අතැති මුදල් | 30.000 | 30,000 |
| | (11,765,081) | (7,736,462) |

පිටු අංක (05) සිට (17) දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේම අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

**2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

## 1. ආයතනික තොරතුරු

1.1 පොදු

2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2013 සැප්තැම්බර් 1 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් ප්‍රකාරව බලය පවරන ලදි. සීමාසහිත ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම ("සමාගම") ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සහ එහි නිත්‍ය වාසය ඇති ආධිපත්‍ය සීමාසහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 4 – 205 හි වන අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම ස්ථානයේම පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය සඳහා උපකරණ සහ සේවා සඳහා ප්‍රසම්පාදනය පහසුකම් සැපයීමයි.

1.3 පිටු අංක (5) සිට (17) දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි.

1.4 වසර අවසානයේදී සේවක සංඛ්‍යාව 42 ක් විය.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 පිළියෙල කිරීමේ පදනම

2014 මාර්තු 31 දින අවසන්වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම්, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිළිපද ප්‍රකාශ සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සුළු සහ මධ්‍ය ප්‍රමාණ ආයතන සඳහා අදාළ වන්නාවූ ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි සියලු ද්‍රව්‍යමය අංග අනුකූල වේ. 2013 මාර්තු 31න් අවසන් වසර සඳහාවූ මෙම මුදල් ප්‍රකාශ සු.ම.ප්‍ර. ආයතන සඳහා ශ්‍රී.ල.මූ.වා. ප්‍රමිති ප්‍රකාරව සමාගම පිළියෙල කළ පළමු මුදල් ප්‍රකාශ වේ.

මූල්‍ය සාධන පත්‍ර හැර ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමින් ඉදිරිපත් කර ඇත

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදු කර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

**2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

2.1.2 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව ආදේශ කර ඇති අතර ඒවා පෙර වසරේ යොදාගත් .ප්‍රතිපත්ති සමග අනුරූප වේ.

2.1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තන

සියලු විදේශ විනිමය ගනුදෙනු, ගනුදෙනු කළ දිනයන්ට අදාළ විනිමය අනුපාතයෙන් වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදලින් අභිධාන කර ඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන මුදලට පරිවර්තනය කරනු ලැබේ. මුදල් නොවන වත්කම් සහ බැරකම්, වටිනාකම් නිශ්චය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදාගනිමින් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ සඳහා හේතු අනෙකුත් විස්තීර්ණ ආදායමේ දක්වා ඇත.

**2.1.4** **බදුකරණය**

***(අ)*** ***ජංගම බදු***

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ ජංගම ආදායම් බද්ද අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගෙන ඇත. ස්කන්ධයන්හි සෘජුව පිළිගෙන ඇති අයිතමයන්ට අදාළ ජංගම ආදායම් බද්ද ස්කන්ධයේ සෘජුවම පිළිගෙන ඇත.

උපයෝගී බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත්වන අවස්ථාවන්ට අදාළව බදු ලාභයන්හි ගෙන ඇති තත්වයන් කළමනාකාරිත්වය වාරිකව ඇගයීමට ලක්කරන අතර යෝග්‍ය විටදී විධිවිධාන ස්ථාපිත කරයි.

**(ආ)** **විලම්බිත බදුකරණය**

මූල්‍ය ප්‍රකාශයන්හි වත්කම් සහ බැරකම් ධාරණ ප්‍රමාණ සහ ඒවායේ අනුරූපී බදු පදනම් (තාවකාලික වෙනස්කම් ලෙස දන්නා) අතර වෙනස්කම් මත විලම්බිත බද්ද පිළිගනු ලැබේ. බදු අය කළ හැකි ලාභය අනාගතයේ වැඩිකරනු ඇතැයි අපේක්ෂා කරනු ලබන සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් පිළිගනු ලබේ. බදු අය කළ හැකි ලාභය අඩු කරනු ඇතැයි අපේක්ෂා කරන සියලු තාවකාලික වෙනස්කම් සඳහා සහ අභාවිත බදු අලාභ සහ අභාවිත බදු ණයවර සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ. විලම්බිත බදු වත්කම් මනිනු ලබන්නේ වත්මන් හෝ ඇස්තමේන්තුගත අනාගත බදු අය කළ හැකි ලාභ පදනම මත අය කර ගැනීමට ඉඩ ඇති වැඩිම ප්‍රමාණයටය. එක් එක් වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම්වලශුද්ධ ධාරණ ප්‍රමාණය සමාලෝචනය කරන අතර අනගත බදු අය කළ හැකි ලාභයේ වත්මන් ඇගයීම පිළිඹිබු වන ආකාරයෙන් ගලපනු ලැබේ.එබදු ඕනෑම ගැලපීමක් ලාභයේ හෝ අලාභයේ පිළිගනු ලැබේ.

පනවා ඇති හෝ වාර්තාකරණ කාල සීමාව අවසානයේදී සත්තාවීව පනවනු ලබන බදු අනුපාත මත පදනම්ව විලම්බිත බදු වත්කම උපලබ්ධි වීමට හෝ විලම්බිත බදු බැරකම පියවීමට අපේක්ෂා කරන කාලසීමාවන්හි බදු අය කළ හැකි ලාභයට ආදේශ කිරීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ට විලම්බිත බද්ද ගණනය කරනු ලැබේ.

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**

**<u>2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා</u>**

**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**

*2.1.5 <u>ණය ගැනුම් පිරිවැය</u>*

ණය ගැනුම් පිරිවැය, ඒවා දරන ලද කාලසීමාවේ වියදමක් සේ පිළිගනු ලැබේ.

*2.1.6 <u>විලම්බිත වියදම්</u>*

එක් මූල්‍ය වර්ෂයකට වැඩි ප්‍රමාණයකට ප්‍රතිලාභය හෝ සබඳතාවක් ඇති යැයි සලකනු ලබන වියදම් විලම්භිත වියදම් ලෙස වර්ගීකරණය කර තිබේ. එබඳු වියදම් සරල රේඛීය පදනමින් එය අදාල වන කාල සීමාවෙන් කපා හරිනු ලැබේ.

***2.2 <u>වත්කම් තක්සේරුව සහ ඒවායේ මැනුම් පදනම්</u>***

***2.2.3 <u>දේපල, පිරියත සහ උපකරණ</u>***

*(අ) <u>පිරිවැය</u>*

දේපල, පිරියත හා උපකරණ වාර්තා කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර පිරිවැයටය. දේපල පිරියත හා උපරකණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමගින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ.

*(ආ) <u>පුනස්ථාපන පිරිවැය</u>*

මුලින්ම තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම, එලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

*(ඇ) <u>ක්ෂයවීම්</u>*

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනය කර ඇත්තේ සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ වටිනාකම මත සරල රේඛීය පදනම යොදාගනිමිනි. යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ :

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 20% |
| කාර්යාල උපකරණ | 20% |
| මෝටර් රථ වාහන | 25% |
| තො. තා. උපකරණ සහ උපාංග | 25% |
| අභ්‍යන්තර අලංකරණ | 50% |

අත්කරගත් දේපල, පිරියත සහ උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය මත වත්කම් ප්‍රයෝජනය සඳහා ගත් මාසයේ සිට ක්ෂය කරනු ලැබේ.

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී, උචිත වේ නම්, වත්කම්හි අවශිෂ්ඨ වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාල, සහ ක්ෂයවීමේ ක්‍රමවේදය සමාලෝචනය කර ගැලපීම් සිදු කරනු ලැබේ.

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

**2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

### 2.2.2 *වත්කම් හානිවීම*

වත්කම්වලට හානි අලාභ සිදුව තිබෙන බවට පෙන්නුම් කිරීමක් තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී දේපල, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ ස්ථාවර තැන්පතු පරීක්ෂා කර බලනු ලැබේ. හානියක් සිදුව ඇති බවට කිසියම් පෙන්නුම් කිරීමක් තිබේනම් හානියට පත්වූ කිසියම් වත්කමක ( හෝ සබැඳි වත්කම් කාණ්ඩයක) අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර එහි ධාරණ වටිනාකම සමග සංසන්දනය කරනු ලැබේ.

කිසියම් හානි අලාභයක් පසුව ප්‍රතිවර්ත වන්නේනම්, වත්කමේ ධාරණ මුදල (හෝ සබැඳි වත්කම් කාණ්ඩයක) එහි අයකර ගත හැකි මුදලේ ( භාණ්ඩ ලේඛනවලදී නම්, සම්පූර්ණ කිරීම සහ විකිණීම සඳහා පිරිවැය අඩුකිරීම විකුණුම් මිල) ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවට ඉහළ නංවනු ලබන නමුත්පෙර වසර වලදී වත්කම (හෝ සබැඳි වත්කම් කාණ්ඩයක්) සඳහා හානිවීමක් පිළිගෙන නොමැත්තේනම් නිර්ණය කරනු ලබන මුදලට වඩා වැඩි නොවිය යුතුය. හානි අලාභ ප්‍රතිවර්තනයක් ලාභ හෝ අලාභවල සැණෙකින් පිළිගනු ලැබේ.

### 2.2.3 *අස්පෘශ්‍ය වත්කම්*

වෙනම අත්කරගත් අස්පෘශ්‍ය වත්කමක් පිරිවැය මූලික පිළිගැනුම මත මණිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩුකර පිරිවැයට ගණනය කරනු ලැබේ.

ප්‍රාග්ධනිත පිරිවැය හැර අභ්‍යන්තරව උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනකරණය නොකරන අතර වියදම දැරූ වර්ෂයේ ලාභ/අලාභවල පෙන්නුම් කෙරේ.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයොජනවත් ආයු කාලය පරිමිත සේ අගයනු ලැබේ.

පරිමිත ආයු කාලයක් ඇතිඅස්පෘශ්‍ය වත්කම් ප්‍රයොජනවත් ආයු කාලය මත ක්‍රිමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානිවී ඇත්තේයැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ.

පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාල සීමාව සහ ක්‍රමක්ෂ ක්‍රම වේදය යටත් පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදි සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේහෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝජන රටාවේ වෙනස්කම්, උචිත පරිදි, ක්‍රමක්ෂ කාල සීමාව හෝ ක්‍රමවේදය වෙනස්කිරීම මගින් ගිණුම්කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සළකනු ලැබේ. පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘෂ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ලාභයේ /අලාභයේ පිළිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් පිළිනොගැනීම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැරකිරීම් උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මණිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී ලාභ/අලාභයේ පිළිගනු ලැබේ.

***ක්‍රමක්ෂය***

වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම විසින් වැය කිරීමට අපේක්ෂා කරන රටාවන් මත පදනම්ව ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන්ට විසර්ජනය කරන කාලසීමාවන් පුරා සරල මාර්ග රේඛා පදනම මත පහත දැක්වෙන අනුපාතයන්ට, වෙනම හෙළිදරව් කර ඇති විවිධ වර්ගයේ වත්කම් හැර අනෙක් ඒවා සඳහා, වත්කම් ප්‍රයෝජනය සඳහා ගත හැකි දිනයේ සිට බැහැර කිරීමේ දිනය දක්වා සමාගම ක්‍රමක්ෂය සපයනු ලැබේ.

පරිගණක මෘදුකාංග වසර 3

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**

**<u>2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා</u>**

**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**

***2.2.4 <u>මූල්‍ය සාධන පත්‍ර</u>***

***<u>වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් හා සමාන දෑ</u>***

මෙම මූල්‍ය වත්කම් ආරම්භයේදී ගනුදෙනු මිලට පිළිගනු ලැබේ. ඉන් පසුව හානි සඳහා ප්‍රතිපාදන අඩු කළ සඵල පොළී ක්‍රමවේදය යොදාගනිමින් ඒවා ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරනු ලැබේ. සාමාන්‍ය ණය කොන්දේසි අනුව විකුණුම් සිදුකරන අතර වෙළඳ ලැබිය යුතු දෑ සඳහා පොළී දරනු නොලැබේ.

ලැබිය යුතු දේවල ධාරණ මුදල් අයකර ගත නොහැකි බවට විෂය බද්ධ සාක්ෂි ඇත්නම්, ලාභ හෝ අලාභවල හානි අලාභයක් පිළිගනු ලැබේ.

***<u>කෙටි කාලීන මූල්‍ය වත්කම්</u>***

අනෙකුත් කෙටි කාලීන මූල්‍ය වත්කම් ස්ථාවර තැන්පතුවලින් සමන්විත වේ. ඒවා ආරම්භයේදී ගනුදෙනු මිලට පිළිගනු ලැබේ. ආරම්භක පිළිගැනීමෙන් පසු කිසියම් හානියක් වේ නම් එය අඩුකර ස්ථාවර වත්කම් ගණනය කරනු ලැබේ.

***<u>මූල්‍ය බැරකම්</u>***

සමාගමේ මූල්‍ය බැරකම්වලට ණය ගැනීම් සහ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අන්තර්ගත වේ. මූල්‍ය බැරකම් ආරම්භයේදී ගනුදෙනු මිලට පිළිගනු ලැබේ. ආරම්භක පිළිගැනීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය යොදාගනිමින් ඒවා ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරනු ලැබේ. වෙළඳ බැරකම් සාමාන්‍ය ණය කොන්දේසි මත වන අතර පොළී දරනු නොලැබේ.

***2.2.5 <u>විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්</u>***

***(අ) <u>නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය</u>***

වත්මන් සහ පූර්ව කාල සීමාවන් තුළදී තම සේවය වෙනුවෙන් සේවකයන් උපයාගෙන ඇති විශ්‍රාම ප්‍රතිලාභ මුදල පිළිබඳ විශ්වසා ඇස්තමේන්තුවක් කිරීම සඳහා ජීව ගණක ක්‍රමවේද යොදාගැනීම අවශ්‍ය කරන්නාවූ, "සේවක ප්‍රතිලාභ"- ශ්‍රී.ල.ගි.ප්‍ර. 19, සමාගම යොදාගෙන ඇති අතර විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීමෙහි සහ වත්මන් සේවා පිරිවැයෙහි වර්තමාන අගය නිර්ණය කිරීම පිණිස ඒකක ණයවර ක්‍රමවේදය යොදාගනිමින් ප්‍රතිලාභ වට්ටම් කරනු ලැබේ. වත්මන් සහ පූර්ව කාලසීමාවන් සඳහා කෙතරම් ප්‍රතිලාභ ආරෝපණය කළ හැකිද යන්න සහ ප්‍රතිලාභයේ පිරිවැයට බලපෑම් කරන්නාවූ ජනවිකාශ සහ මූල්‍ය විචල්‍යයන් ආයතනය නිර්ණය කිරීමද මෙමගින් අවශ්‍ය වන්නේය"සේවක ප්‍රතිලාභ"- ශ්‍රී.ල.ගි.ප්‍ර. 19. ප්‍රකාරව පාරිතෝෂික සූත්‍රය භාවිත කරමින් ඉහත සංඛ්‍යාවන් තීරණය කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන උපකල්පනයන් සිදුකරන ලදී.

(ආ) පොළී අනුපාතය 12.40%

(ඇ) වැටුප් වර්ධක අනුපාතය 9.0%

(ඈ) විශ්‍රාම ගන්නා වයස

කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම ගන්නා වයස අවුරුදු හැටකි (60). කෙසේවෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවා දීර්ඝකිරීම් ලබාදෙන කාර්ය මණ්ඩලය සඳහා වූ විශ්‍රාම ප්‍රතිලාභ අවුරුදු හැට පහක (65) උපරිමයක් දක්වා ගණනය කරනු ලැබේ.

(ඉ) කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය 30%

බැරකම සඳහා බාහිර අරමුදල් සැපයීමක් හෝ ජීවගණක තක්සේරු කිරීමක් සිදු නොවේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ, ප්‍රතිපාදන සහ අනෙකුත් බැරකම් යටතේ වර්ග කර ඇත.

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**
**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**
**<u>2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා</u>**
***<u>විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් (තව දුරටත්....)</u>***

***(ආ) <u>නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල</u>***

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව සේවකයින්, සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා සුදුසුකම් ලබයි.

***2.2.6 <u>ප්‍රදාන සහ සහනාධාර</u>***

අය වූ හෝ අයවීමට නියමිත වත්කම්හි සාධාරණ වටිනාකමට ආයතනයක් ප්‍රදාන ගණනය කළ යුතුය.

සාධාරණ වටිනාකම් ඇති මුදල් නොවන ප්‍රදානයන් ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදාන සහ සහනාධාර, වත්කමෙහි ධාරණ වටිනාකමට පැමිණි විටදී අඩු කරනු ලැබේ.

***2.2.7 <u>අසම්භාව්‍ය බැරකම්</u>***

අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොමැත.

***2.2.8 <u>වාර්තාකරණ කාලසීමාව අවසානයෙන් පසුව සිදුවීම්</u>***

වාර්තාකරණ කාලසීමාවේ අවසානයෙන් අනතුරුව සිදුවීම් නොමැත.

***2.3 <u>විස්තීර්ණ ආදායම් ප්‍රකාශය</u>***

***2.3.1 <u>ආදායම පිළිගැනීම</u>***

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ප්‍රවාහය වීමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම පිළිගනු ලැබේ. ආදායම මනිනු ලබන්නේ වෙළඳ මට්ටම සහ විකුණුම් බදුවලින් ශුද්ධ වූ ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමටය. ආදායම් පිළිගැනීමේ කාර්යය සඳහා පහත දැක්වෙන නිශ්චිත නිර්ණායක යොදාගනු ලැබේ.

***(ආ) <u>භාණ්ඩ අලෙවිය</u>***

හිමිකාරිත්වය හා සාමන්‍යයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**
**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**
**<u>2014 මාර්තු 31 දිනෙන් අවසන් වසරසඳහා</u>**

***(ආ)*** ***<u>සේවාවන් සැපයීම</u>***

සේවාවන් සැපයීමෙන් ලැබෙන ආදායම, එම සේවාවන් සැපයූ හෝ ඉටු කළ ගිණුම්කරණ කාලසීමාව තුළදී පිළිගනු ලැබේ.

***(ඇ)*** ***<u>පොලිය</u>***

පොලී ආදායම උපාර්ජන පදනමකින් පිළිගනු ලැබේ.

***(ඈ)*** ***<u>කුලී ආදායම</u>***

කුලී ආදායම උපාර්ජන පදනමකින් පිළිගනු ලැබේ.

***(ඉ)*** ***<u>අනිකුත්</u>***

*<u>අනිකුත් ආදායම්</u>* උපාර්ජන *<u>පදනමකින් පිළිගනු ලැබේ.</u>*

දේපළ, පිරියත උපකරණ සහ ආයෝජන ඇතුළු අනෙකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, බැහැර කිරීම් මත උත්පාදන වත්කම් වල ධාරණ මුදල් ප්‍රමාණය සහ ආශ්‍රිත විකුණුම් වියදම් වලින් අඩුකිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත (ප්‍රත්‍යාගණනය කරන ලද දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේදී, වත්කමට අදාලව ප්‍රත්‍යාගණන සංචිතයේ ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය, ඍජුවම සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.)

## ***2.3.2*** ***<u>වියදම් පිළිගැනීම</u>***

(අ) විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයුම් අතර ඍජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදු වූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

(ආ) විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මන්ඩලයේ අදහස වනුයේ 'වියදමේ ශ්‍රිතය' ක්‍රමය සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණව ඉදිරිපත් කරන බවය. එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය යොදා ගෙන තිබේ.

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

2014 මාර්තු 31 දිනෙන් අවසන් වසරසඳහා

| | 2014 රු .ශත | 2013 රු .ශත |
|---|---|---|
| **(3) ආදායම** | | |
| **වෙළඳ** | | |
| පැරෂුට් අලෙවිය | - | 44,871,758 |
| **සේවා** | - | 44,871,758 |
| පරිපාලන ගාස්තු | 59,050,884.55 | 75,367,059 |
| ලියාපදිංචි ගාස්තු-සැපයුම් | 5,000.00 | 886,082 |
| ආ.මූ ව්‍යාපෘති කළමනාකරණ ගාස්තු | 4,491,176.78 | 8,151,036 |
| නා.ස.අ. සඳහා ආයතනික සැලස්ම පිළියෙල කිරිම | | 3,826,531 |
| ව්‍යාපෘති උපදේශන සහ කළමනාකරණ ගාස්තු | 33,478,594,14 | - |
| ආදායම මත ජා.ආ.බ. | (1,851,536.00) | (2,483,560) |
| | 95,174,119.47 | 85,747,148 |
| | 95,174,119.47 | 130,618,906 |
| **(4) අනෙකුත් මෙහෙයුම් ආදායම** | | |
| ප.ස.ම. ව්‍යාපෘතියේ අධි සැපයූ පිරිවැය | 747,405.11 | - |
| වත්කම් විකිණීම | 917,865.00 | - |
| විවිධ ආදායම් | - | 314,816 |
| ආ.හ.මූ. මත හිමිකම් පාන ලද පිරිවැය ප්‍රතිපූරණය | 1,162,995.00 | - |
| | 2,828,265.11 | 314,816 |

**(5) මෙහෙයුම් ලාභය සඳහන් කර ඇත්තේ පහත දැක්වෙන දෑ ඇතුළුව සියලුම වියදම් අය කිරීමෙන් පසුවය.**

| | 2014 | 2013 |
|---|---|---|
| වැටුප් | 36,545,675 | 39,681,410 |
| සේ.අ.අ | 4,385,481 | 4,170,332 |
| සේ.භා.අ | 1,096,370 | 1,042,583 |
| පාරිතෝෂික | (40,116) | 579,508 |
| *විගණකවරුන්ගේ පාරිශ්‍රමිකය* | 155,000 | 130,000 |

**(6) මූල්‍ය පිරිවැය**

| | 2014 | 2013 |
|---|---|---|
| බැංකු ගාස්තු | 16,525.00 | 9,604 |
| අයිරා පොලිය | 1,790,649.84 | 2,997,696 |
| | 1,807,174.84 | 3,007,300 |

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**

**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**

2014 මාර්තු 31 දිනෙන් අවසන් වසරසඳහා

| සටහන | 2014 | 2013 |
|---|---|---|
| **(7) මූල්‍ය ආදායම** | රු .ශත | රු. ශත |
| පොළී ආදායම- ස්ථාවර තැන්පතු | 7,763,162 | 6,464,159 |
| පොළී ආදායම- ඉතුරුම් ගිණුම | 55,838 | 109,039 |
| | 7,818,999.44 | 6,573,199. |
| **(8) ආදායම් බදු වියදම්** | | |
| වසර සඳහා ප්‍රතිපාදන | 4,336,726.00 | 3,272,885 |
| (-)අධි ප්‍රතිපාදන-2012/2013 | (172,636.00) | - |
| විලම්බිත බදු ප්‍රතිපාදන/වසර සඳහා (ප්‍රත්‍යාවර්තනය) (13) | 533,454.00 | (38,353) |
| | 4,697,544.00 | 3,234,532. |

(9) **කොටසකට ඉපැයුම**

කොටසක් සඳහා මූලික ඉපැයුම් ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණීය වසරේ ශුද්ධ ලාභය වසර තුළ නොගෙවූ සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙනි.

| | 2014 | 2013 |
|---|---|---|
| සාමාන්‍ය කොටස්වලට ආරෝපණීය ශුද්ධ ලාභය (රු.) | 10,875,692.12 | 14,145,634 |
| වසර තුළ නොගෙවූ බර තැබූ කොටස් සාමාන්‍ය සංඛ්‍යාව | 898,835 | 205 |
| කොටසකට ඉපැයුම් | 12.10 | 69,003 |

**<u>ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම</u>**

**<u>මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්</u>**

**<u>2014 මාර්තු 31 දිනට</u>**

**<u>(10) දේපල, පිරියත සහ උපකරණ</u>**

| ***10.1 දළ ධාරණ මුදල් ප්‍රමාණය*** | ***2013.04.01 දිනට ශේෂය*** | ***එකතු කිරීම් මාරුකිරීම්*** | ***බැහැර කිරීම්/ මාරුකිරීම්*** | ***2014.03.31 දිනට ශේෂය*** |
|---|---|---|---|---|
| *දළ ධාරණ මුදල් ප්‍රමාණය* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| මෝටර් රථ | 15,323,061.46 | 133,500.00 | (2,071,978.00) | 13,384,583.46 |
| අභ්‍යන්තර අලංකරණය | 7,586,805.31 | - | - | 7,586,805.31 |
| පරිගණක සහ උපාංග | 6,955,899.46 | 1,435,470.00 | - | 8,391,369.46 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 3,553,876.00 | - | - | 3,553,876.00 |
| කාර්යාල උපකරණ | 2,966,913.00 | 330,065.00 | - | 3,296,978.00 |
| | 36,386,555.23 | 1,899,035.00 | (2,071,978.00) | 36,213,612.23 |

| ***(10.2)ක්ෂයවීම්*** | ***2013.04.01දිනට සමු. ක්ෂය*** | ***වර්ෂය සඳහා ක්ෂයවීම*** | ***බැහර කිරීම්/ මාරුකිරීම්*** | ***2014.03.31දිනට සමු ක්ෂය*** |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| මෝටර් රථ | 10,873,447.62 | 1,686,139.00 | (1,849,343.04) | 10,710,243.58 |
| අභ්‍යන්තර අලංකරණය | 6,790,440.62 | 743,873.00 | - | 7,534,313.62 |
| පරිගණක සහ උපාංග | 4,359,206.90 | 1,242,682.00 | - | 5,601,888.90 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 2,538,338.30 | 331,948.05 | - | 2,870,286.35 |
| කාර්යාල උපකරණ | 1,943,548.84 | 402,653.02 | - | 2,346,201.86 |
| | 26,504,982.28 | 4,407,295.07 | (1,849,343.04) | 29,062,934.31 |
| | | | | |
| ශු.පො.ව. | 9,881,572.95 | | | 7,150,677.92 |

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
**2014 මාර්තු 31 දිනට**

**(11) අස්පෘශ්‍ය වත්කම්**

| *පිරිවැය* | *2013.04.01 දිනට ශේෂය* | *එකතු කිරීම් මාරුකිරීම්* | *බැහැර කිරීම්/ මාරුකිරීම්* | *2014.03.31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| ඊ.එස්.බී. පද්ධතිය | 2,104,763.64 | - | - | 2,104,763.64 |
| | 2,104,763.64 | - | - | 2,104,763.64 |

| *ක්‍රමක්ෂය* | *2013.04.01 දිනට ශේෂය* | *වසර සඳහා ගාස්තු* | *බැහැර කිරීම්/ මාරුකිරීම්* | *2014.03.31 දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| ඊ.එස්.බී. පද්ධතිය | - | 701,587.84 | - | 701,587.84 |
| | - | 701,587.84 | - | 701,587.84 |

| | | | | |
|---|---|---|---|---|
| ශු.පො.ව. | 2,104,763.64 | | | 1,403,175.80 |

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**2014 මාර්තු 31 දිනට**

| | *2014* | *2013* |
|---|---|---|
| | *රු. ශත* | *රු.* |
| **(12) විලම්බිත බදු වත්කම්** | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 541,627.00 | 503,274 |
| වසර සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තනය) | (533,454.00) | 38,353 |
| වර්ෂය අවසානයෙදී ශේෂය | 8,173.00 | 541,627 |
| *පහත සඳහන් දෑ ආශ්‍රිත අවසාන විලම්බිත බදු බැරකම* | | |
| බදු කාර්යයන් සඳහා කඩිනම් ක්ෂයකිරීම් | (396,107.00) | 133,335 |
| සේවක ප්‍රතිලාභ බැරකම | 404,280.00 | 408,292 |
| | 8,173.00 | 541,627 |
| **(13) ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | 35,189,276.51 | 79,742,682 |
| | 35,189,276.51 | 79,742,682 |

ලංකා බැංකුවේ ඉහත ස්ථාවර තැන්පතු සහතිකය අයිරා පහසුකම සඳහා ඇපයක් ලෙස බැංකුව රඳවා ගනු ලැබ තිබේ.

| | | |
|---|---|---|
| **(14) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 118,337,111.00 | 50,808,278 |
| අනෙකුතු ලැබිය යුතු දෑ සහ ව්‍යාපෘති ජංගම ගිණුම් | 1,372,832.63 | 25,738,550 |
| අත්තිකාරම්, තැන්පතු සහ පූර්ව ගෙවීම් | 1,355,514.28 | 208,049 |
| | 121,065,457.91 | 76,754,877 |
| **(15) ආදායම් බදු ලැබීම්** | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 2,527,197.17 | 4,579,871 |
| අධි ප්‍රතිපාදන- 2012/2013 | 172,636.00 | |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | (4,336,726.00) | (3,272,885) |
| | (1,636,892.83) | 1,306,986 |
| | 1,642,567.00 | - |
| **එකතු කළා:** බදු ගෙවීම් | | |
| ආර්ථික සේවා ගාස්තු | - | 561,578 |
| විශේෂිත ගාස්තු | - | 2,000 |
| රඳවාගත් බදු | 707,365.77 | 656,633 |
| වර්ෂය අවසානයෙදී ශේෂය | 713,039.94 | 2,527,197 |
| **(16) මුදල් හා මුදලට සමාන දෑ** | 2,257.00 | 11,740 |
| ලංකා බැංකුව-ඉතුරුම් ගිණුම | 195,526.00 | 24,170 |
| සම්පත් බැංකුව- ඉතුරුම් ගිණුම | 30,000.00 | 30,000 |
| අතැති මුදල් | 227,783.00 | 65,910 |

**ලංකා ලොජිස්ටික්ස් සහ ටෙක්නොලොජීස් සමාගම**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
**2014 මාර්තු 31 දිනට**

| | *2014* | *2013* |
|---|---|---|
| | *රු .ශත* | *රු.* |
| **(17)ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 80,002,050.00 | 2,050 |
| | 80,002,050.00 | 2,050 |
| **(18) මූලික ප්‍රාග්ධනය** | | |
| මූලික ප්‍රාග්ධනය | - | 100,000,000 |
| | - | 100,000,000 |

මූලික ප්‍රාග්ධනය සපයනු ලැබුයේ යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව විසින් වන අතර නොගෙවූ ශේෂය ශ්‍රී ලංකා පොලීසියෙනි

| | | |
|---|---|---|
| **(19) සේවක ප්‍රතිලාභ බැඳීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 4,082,916.00 | 3,503,408 |
| වසර සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තනය) | (40,116.00) | 579,508 |
| වසර අවසානයේ ශේෂය | 4,042,800.00 | 4,082,916 |

| | | |
|---|---|---|
| **(20)වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ** | | |
| වෙළඳ ණයගැතියෝ | 6,599,639.64 | 12,443,562 |
| උපචිත වියදම් සහ අනෙකුත් | 32,959,660.00 | 27,897,853 |
| | 39,559,299.64 | 40,341,415 |